# <u>සමාජයක් ලෙස අප රටේ අවසාන ඉලක්කය සමලිංගිකත්වයද?</u>

ශ්‍රී ලාංකේය සමාජයේ අති දැවැන්තවූ බහුතරයක් ජනතාව සමරිසි බව, සමලිංගිකත්වය සහ ඒ ආශ්‍රිත සියලු ක්‍රියාකාරකම්, ස්වභාවිකත්වයෙන් තොර විකෘතියක් ලෙස සලකා ප්‍රතික්ෂේප කරති. සිංහල බෞද්ධ, සිංහල කතෝලික, දමිල හින්දු, දමිල කතෝලික, මුස්ලිම් ඉස්ලාම්, බර්ගර්, මැලේ ආදීවූ සියලු ජන ප්‍රජාවන් මෙන්ම සියලු දේශපාලන පක්ෂවලට අයත් බහුතර ජනතාවද, මෙම දැවැන්ත බහුතරයට අයත් වෙයි.

රටේ ජනගහනයෙන් ඉතා සුළුතරයක් වන සමරිසි ප්‍රජාවේ ඡන්ද ලබාගැනීමට මාන බලන යම් දේශපාලන පක්ෂ මෙම සමරිසි කණ්ඩායම්වල ප්‍රසාදය දිනාගැනීමට කටයුතු කරන බවද ඒ අතර පෙනෙන්නට තිබේ.

කෙසේවෙතත්, අප සමාජයේ සමලිංගිකත්වය ප්‍රවර්ධනයට උඩගෙඩි දෙන එවන් විසංවාදී පිරිස් විසින් සමරිසි බව පිළිබඳව, සමලිංගිකත්වය පිළිබඳව, LGBTIQ (Lesbian, Gay, BiSex, TransGender, InterSex, Questionable) කණ්ඩායම් පිළිබඳව, කතාබහක් අතීතයේ සිටම ඇති කරමින් සිටි බව අපි හොඳින් දන්නා කාරණයකි. මෙය එක් එක් කාලවලදී අඩු වැඩි වශයෙන් මතුවන ඉතා ඈත අතීතයක් ඇති සමාජ ගැටළුවකි.

එමෙන්ම සමලිංගික කටයුතුවලට යම් ආකාරයක ලැදියාවක් ඇති යම් යම් දේශපාලන නායකයින් අතට බලය ලැබුණු විට, මෙම සමරිසි/සමලිංගික කතාබහ සමාජයේ උඩ ස්ථරයට ඇදී එන බව, විවිධ වකවානුවල අප අත්විඳ ඇත්තෙමු.

මෙම සමරිසි/සමලිංගික කටයුතුවලට ඇබ්බැහිවූ, එම ලිංගිකත්වයේ අවශ්‍යතාවට ඇල්මක් දක්වන අය, ඒ වෙනුවෙන් පෙනී සිටීම අපට තේරුම් ගත හැකිය. එහෙත් ඒ අය හැරුණුකොට, සමලිංගිකත්වය පිළිබඳ කතාබහට අනුග්‍රහය දක්වන්නේ කවුද යන්න සොයා බැලීමද අද දවසේ අත්‍යවශ්‍ය කාරණයක් වන තරමට මේ උවදුර වර්තමාන සමාජයේ ඔඩු දුවා ඇත.

යම් පුද්ගලයකුට හෝ යම් පුද්ගල කණ්ඩායමකට හෝ සමරිසි අවශ්‍යතා, සමලිංගික අවශ්‍යතා ආදී වශයෙන් යම් අසාමාන්‍ය, විකෘති ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය නම්, එය ඔවුන්ගේ කැමැත්ත නිසාවෙන්, ඔවුන්ට කැමති ලෙස පෞද්ගලිකව එහි නියැලෙන්නට ඉඩ හැරීම එක කාරණයකි.

සමාජයීය වශයෙන් එය අසාමාන්‍යයක් හෝ විකෘතියක් හෝ වුවද, එය ඔවුන්ගේ අයිතියක් යැයිද කෙනෙකුට කිව හැක. කෙසේ වෙතත් එය ඔවුන්ගේ කැමැත්ත නම්, ඔවුන් උපතින්ම එවන් භෞතික ස්වරූපයන්ගෙන් යුක්ත නම් සහ උපතින්ම ඔවුන් එවන් මානසිකත්වයන් සහිත වී නම්, ඔවුන්ට අවශ්‍ය පරිදි සමරිසි/සමලිංගික කටයුතු කරගැනීමට ඉඩ හැරීම සමාජයීය වශයෙන් කළ යුතු දෙයක් යැයි අපට පිළිගත හැකිය. ඔවුන්ට වෙනස් ලෙස නොසැලකීමට සමාජය තුළ ආකල්ප වර්ධනයක්ද ඇතිකිරීම වඩා අගනේය.

එහෙත් එම අසාමාන්‍ය ජීවන රටාව, සාමාන්‍ය ලෙස මෙන්ම, ස්වභාවික ලෙස ජීවත්වීමට කැමති සමස්ත සමාජයේ දරුවන් හෝ මිනිසුන් මත බලහත්කාරයෙන් පැටවීමට, පෙර කී

විකෘති අදහස් දරන අයට කිසිම අයිතියක් නැත. එය ඉතා පැහැදිලිවම සමස්ත සමාජයේ අති බහුතරයකගේ මානව හිමිකම් කඩකිරීමකි.

සියයට දශම ගණනක්වත් නැති සමරිසි/සමලිංගිකයන් වෙනුවෙන් සමාජයේ මහත් ආන්දෝලනයක් ඇති කිරීම, මාධ්‍ය සහයද භාවිතා කරමින් එය විලාසිතාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමට උත්සාහ දැරීම ආදිය කිසිසේත්ම නොකළ යුතු නොමනා ක්‍රියාවන් වෙයි. ඒවා මැදහත් සිතින් දරාගෙන, ඒවාට ඉඩදීමද කිසිසේත්ම කළ යුතු නොවේ.

සමලිංගිකයන් වෙනුවෙන් සමාජයේ මහත් ආන්දෝලනයක් ඇති කිරීමට උත්සාහ දරන අය ගෙනෙන මූලික අදහසක් වන්නේ සමරිසි/සමලිංගික අයවළුන්ට සමාජය වෙනස් කොට සලකන බවත්, ඔවුන් කොන් කිරීමට කටයුතු කරන බවත්ය.

මෙය සත්‍යයෙන් දුරස්තවූ කතාවකි. එවන් දෙයක් සිදුවන බවට ඇති සාධක අතිශයින් අල්පය. සමරිසි/සමලිංගික යැයි නම්දරා ඇති සමනල දේශපාලකයින් යම් සංඛ්‍යාවක් ලාංකික දේශපාලනයේ සිටී. එහෙත් සමරිසි හෝ සමලිංගිකවීම හේතු කොටගෙන කිසිදු අයුරකින් ඔවුන් සමාජය විසින් වෙනස් කොට සලකා හෝ කොන් කර හෝ නොමැත. ඔවුහු සමාජයේ ඉහළ වරප්‍රසාදද භුක්ති විඳිමින් සිටිති.

ඔවුන් පමණක් නොව සමරිසි/සමලිංගික කණ්ඩායම්වල මූලිකත්වය දරාගෙන ඔවුන්ගේ අයිතිවාසිකම් ගැන හඬ නගන කණ්ඩායම්වලට අයිති යම් යම් නායකයන් ගැන අවධානය යොමු කර බලන විට ඔවුන්ටද, සමාජය විසින් වෙනස් කොට සලකා හෝ ඔවුන් කොන් කර හෝ නොමැති බව පෙනී යයි.

දැනටමත් සමරිසි/සමලිංගික පුද්ගලයින් (රාජ්‍ය සහ පෞද්ගලික අංශවල) ඉහළම තනතුරුවල සිටීම, ඔවුන් සමරිසි හෝ සමලිංගිකවීම හේතු කොටගෙන, ඔවුන්ට වෙනස් කොට සලකා නැති බව පැහැදිලි වන තවත් කාරණයකි. ඔවුහු සමාජයේ ඉහළ වරප්‍රසාද භුක්ති විඳිමින් සිටින අය බව ඔප්පු කිරීමට ඕනෑ තරම් සාධක ඇත. එබැවින් සමරිසි/සමලිංගික අයවළුන් ගෙනෙන, **"ඔවුන් සමාජයෙන් කොන්කර ඇතැයි"** යන තර්කය වලංගු එකක් නොවන්නේය.

එහෙත් වර්තමානයේ මෙම සමරිසි/සමලිංගික ප්‍රශ්නය ඉහත කරුණුවලට වඩා බරපතල, භයානක සමාජ උවදුරක් බවට පත්වී ඇත. සමරිසි/සමලිංගික විවාහ දක්වා පැතිර ගොස් ඇති මෙම ව්‍යසනය, ඉන් ඔබ්බට ඇදී යමින් ළදරුවන්, යෞවනයන් සමලිංගිකත්වයට යොමු කිරීමේ සංවිධානාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක වන, බලහත්කාරයෙන් එම යෞවනයන් සමලිංගික සැත්කම්වලට භාජනය කරන, එනම් ගැහැණු පිරිමින් බවට පත්කිරීම සහ පිරිමි ගැහැණුන් බවට පත්කිරීම සිදු කරන සමලිංගික සැත්කම් දක්වා ප්‍රශ්නය ඔඩු දුවා ඇත.

මෙයට සමාන්තරව වර්තමානයේ නව යෞවනයන් මුහුණ දෙන භයානක ගැටලුවක්වී ඇත්තේ **"සජීවජාල මොළ සේදීම"**යි. එනම් online brain washing. මෙය විවිධ ආකාරයෙන් සිදුවෙයි.

1. උපන් පුම්තිරි භාවය, පිරිමි/ගැහැණු බව වෙනස් කරවීම (changing gender)

2. ආගම අතහැරවීම, වෙනස් කරවීම හෝ නිරාගමික කරවීම. සදාචාර වටිනාකම් නොසලකන තත්ත්වයට පත් කිරීම. (මෙය සමලිංගිකත්වයට උඩගෙඩි දීමකි.)
3. දෙමාපියන් හා පවුල අතහැර දමා, ඔවුන්ගේ උපදෙස් නීතිරීති ඉවත දා, තමන්ට තනියම ජීවිතය ජයගැනීම පහසුවෙන් කළ හැකි එකක් බව ඒත්තු ගැන්වීම (to kick out parents) (මෙයද සමලිංගික කටයුතුවලට පාර කැපීමකි.)
4. උසස් අධ්‍යාපනය සඳහා කාලය නාස්ති නොකර, පහසු (ඊනියා) උපක්‍රම මගින් පහසුවෙන් මුදල් ඉපයිය හැකි බව ඒත්තු ගැන්වීම. (යෞවනයන්ගේ අධ්‍යාපනික මනස වැනසීම. මේ හරහා ඔවුන් මහමගට ඇද දැමීම සිදු කෙරේ.)
5. දෙමාපියන්, ගුරුවරුන් ඇතුළු වැඩිහිටියන්ගේ උපදෙස්වලට කන් නොදිය යුතු බව, සලකා බැලිය යුතු නැති බව. ඔවුන් සියලු දෙනා අද, යල්පැන ගොස් ඇති අය බව ඒත්තු ගැන්වීම.
6. සාධාරණ යහපත් තරඟය ප්‍රතික්ෂේප කිරීම. Rejection of Fair Competition
7. තරඟ හෝ අන් අය ජය ගැනීමේදී, තමන් ගැන පමණක් සිතා එය කළ යුතු බව ඒත්තු ගැන්වීම. (අනෙකා ගැන නොසිතා ආත්මාර්ථකාමීව අන් අය පැරදවීම)
8. ආදරය හා විවාහය වැදගත් නැති බව ඒත්තු ගැන්වීම. මුදල්ගෙවා රාගය සන්තර්පණය කිරීම ලාභදායී එකක් බව පෙන්වීම. සමලිංගිකත්වය ආශ්වාදනීය එකක් බව ඒත්තු ගැන්වීම.

ආදී වශයෙන් මෙය විවිධ ආකාරයෙන් සිදුවෙයි. මෙය ඉතා දරුණු ව්‍යසනයක් බව අමුතුවෙන් කිව යුතු නැත. යෞවනයන් වනසන මෙම විනාශකාරී ව්‍යාපෘතීන් ගැන වැඩිහිටියන්ගේ මෙන්ම රජයේද අවධානය වහ වහා යොමු විය යුතුය.

පෙරදිග රටවල මෙන් ඓතිහාසික සදාචාරාත්මක සංස්කෘතීන් සහ සදාචාරාත්මක ආගමික සංස්කෘතීන් බල නොපවත්වන බටහිර රටවල මෙම සමරිසි/සමලිංගික විකෘතියට යම් යම් අවස්ථාවල දුරදිග නොබලා දුන් නීතිමය රැකවරණයන් හේතු කොටගෙන, දැන් එම රටවල සමලිංගිකත්වය ඒ ඒ සමාජයන් වනසන ව්‍යාපාරයක් බවට පත්වී ඇත.

සමලිංගික සැත්කම්වලට දුන් ඒ ඒ රටවල රාජ්‍ය අනුමැතියන් හේතු කොට ගෙන, දැන් වසංගතයක් මෙන් එය සමාජය පුරා පැතිරී යාමත්, එම සැත්කම්වලින් පසුව, එම සැත්කම්වලට භාජනය වන යෞවනයන්ට තම මුළු ජීවිත කාලය පුරාම, නොකඩවා අදාළ ඖෂධ වර්ග ගැනීමට සිදුවීමත් නිසා, එම රටවල ෆාමසිකරුවන්ට සහ ඖෂධ නිෂ්පාදන සමාගම්වලට මෙය 'කල්ලමරේ' ව්‍යාපාරයක් බවට පත්වී ඇත. එබැවින් බටහිර රටවල සමරිසි/සමලිංගිකත්වය ප්‍රවර්ධනය කරන්නන් පසුපස, මෙම ඖෂධ නිෂ්පාදන සමාගම් සහ ෆාමසිකරුවන්ද සිටින බවට තොරතුරු වාර්තා වී ඇත.

දැන් එම බටහිර රටවල දෙමාපියන් දෙකොණ පත්තුවී දඟලති. තම දරුවන් දවාලන මෙම විකෘති සමරිසි/සමලිංගික ගින්න නිවා ගන්නේ කෙසේදැයි දිවා රෑ දෙකෙහි සුසුම්ලමින් කල්පනා කරති. මුලදී සමරිසි/සමලිංගිකත්වය බටහිර රටවල රජයයන් විසින් විවිධ අනපනත්වලින් අනුමත කරන විට නිහඬව සිටි, එම රටවල දෙමව්පියෝ දැන් තම දරුවන් මෙම විකෘති සමාජ ව්‍යසනයෙන් ගලවා ගැනීම සඳහා, එම අනපනත්වලට විරුද්ධව නැගී සිටින බව, බටහිර මාධ්‍යවල කොතෙකුත් දකින්නට ලැබේ. එහෙත් දැන් වෙන්න තියෙන

හානිය සිදුවී හමාරය. ඉස්තාලය වැසුවාට වැඩක් නැත. අශ්වයා සමලිංගික විකෘතියෙන්ම ගාල කඩාගෙන පැන ගිහින්ය.

මේ විනාශය අප රටේද සිදුවීමට පෙර අප නිසි පියවර ගත යුතුය. අප සමාජයේ සමලිංගිකත්වය පිළිබඳ කතාබහට අනුග්‍රහය දක්වන්නේ කවුද යන්න සොයා බැලීම අත්‍යවශ්‍ය කාරණයක් වන්නේ එබැවිනි.

එවිට, මෙම ක්‍රියාකාරකම් සමාජය පුරා පැතිරවීමට, අවශ්‍ය අය එලෙස ඉටු කරන්නට උත්සාහ දරන්නේ, සැබැවටම සමරිසි ප්‍රජාවට ඇති ඇල්ම නිසාද, නැතහොත් ඒ ඔස්සේ තමන්ගේ වෙනත් යටි අරමුණු ඉටු කරගැනීමට මාන බලන නිසාද යන්න කාහටත් අවබෝධ කොට ගත හැකිවෙයි.

උපතින්ම අදාළ භෞතික ස්වරූපයන් සහිත සහ සමරිසි මානසිකත්වයන් සහිත අය, තම අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටීම ස්වභාවිකය. එහෙත් ඉතා උනන්දුවෙන් සහ සමීපව බලන කල, පෙනී යන පැහැදිලි කාරණය වන්නේ සමරිසි/සමලිංගිකත්වයට උදව් දෙන අති බහුතරය, **මේ රටේ ප්‍රධාන ප්‍රවාහයෙන් බැහැරවූ, ජාතිකත්ව විරෝධී, පෙරදිග සංස්කෘතික විරෝධී, නිරාගමික, අන්තගාමී අදහස් දරණ, අසංස්කෘතික, මානසිකව අභ්‍යන්තර විසංවාදයන්ගෙන් පෙළෙන, සමාජයේ පවතින යහපත්කම්වලට එරෙහි, සමාජයේ ප්‍රධාන ප්‍රවාහයට පිළිගත නොහැකි විකෘති මතවාදයන් කරපින්නාගත්,** පුද්ගලයන් බවයි.

එපමණක්ද නොව, සමරිසි/සමලිංගිකයන් වෙනුවෙන් රාජ්‍ය නොවන සංවිධාන අටවාගෙන, ඩොලර් සූරාකන සමාජ ක්‍රියාකාරීන්ද සිටින බව අප අමතක කළ යුතු නොවේ.

එබැවින් සමලිංගිකත්වයට උදව් දෙමින්, එය සාමාන්‍ය සමාජයේ උඩුතලයට ගෙන අවුත් සමාජය තුළ මහා කතාබහක් නිර්මාණය කිරීමට උත්සාහ දරන, විකෘති මනස් සහිත එම පිරිසට ඇහුම්කන් දීම, රටක මහා සමාජයට, ප්‍රධාන ප්‍රවාහයට කරන අගතියක් බව, ආණ්ඩුව මේ මොහොතේ සැලකිල්ලට ගත යුතු වෙයි.

රටක ආණ්ඩුව හෝ ජනසමාජය හෝ, සැබෑම සමරිසි/සමලිංගික අවශ්‍යතාවන් ඇති අයගේ ඉල්ලීම්වලට කන්දී ඒවාට සාධාරණය ඉටුකිරීම යුක්තියුක්තය.

එහෙත්, සමරිසි අයගේ ඉල්ලීම් පෙරට දමාගනිමින්, තම යටි අරමුණු ඉටු කරගැනීමට මාන බලන කණ්ඩායම්වල ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම වෙනමම ව්‍යාපෘතියකි.

මේ දෙක කිසිසේත්ම රටක ආණ්ඩුව විසින් හෝ ජනසමාජය විසින් හෝ පටලවා නොගත යුතුය. එමෙන්ම ආණ්ඩුවේම යම් යම් නායක කාරකාදීන් සමරිසි අදහස් දරන්නේ නම්, එනම් වැටත් නියරත් ගොයම් කා නම්, ඒ අවනඩුව කාට පවසම්? සමස්ත ජන සමාජයම නොවෙයිද අතරමං?

## සිංහල බෞද්ධ, සිංහල කතෝලික, දමිල හින්දු, දමිල කතෝලික, මුස්ලිම් ඉස්ලාම්, බර්ගර්, මැලේ ආදීවූ සියලු ජන ප්‍රජාවන් නියෝජනය කරන “යහපත් පුරවැසියෝ” සංවිධානය